# ගණිතය

## පළමුවන ශ්‍රේණිය

### තුන්වන වාරය

<u>ගුරු මාර්ගෝපදේශයට අනුව සම්පාදිතයි</u>

**සැකසුම : බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**



# 5 තෙක් වූ ද්‍රව්‍ය සංඛ්‍යාවකින් තවත් ද්‍රව්‍ය සංඛ්‍යාවක් අඩු කිරීම



**ක්‍රියාකාරකම 01 - ඉතුරු ගණන සොයමු**

**සපයා ගත යුතු දේ -**

- ඔබට පහසුවෙන් සපයාගත හැකි රබර් ඇට, සියඹලා ඇට වැනි ඇට වර්ගයක් හෝ යෝගට් හැඳි, මූඩි ආදියෙන් 5 බැගින් හොඳින් පිරිසිදු කර ගන්න
- කුඩා වට්ටියක්, යෝගට් කෝප්පයක් වැනි භාජනයක්

**දෙමාපියන්ට උපදෙස් -**

- සපයා ගත් ද්‍රව්‍ය 5ක් භාජනයට දමන්න.
- එහි ඇති ද්‍රව්‍ය ප්‍රමාණය ගණන් කිරීමට දරුවාට කියන්න.
- ඊළඟට භාජනයෙන් ද්‍රව්‍ය කීපයක් ඉවත් කිරීමට  කියන්න.
- "දැන් වට්ටියේ ඇති ඉතුරු ද්‍රව්‍ය ගණන කීයද?" යි අහන්න.
- එය  මෙසේ පැහැදිලි කර දෙන්න.
    - වට්ටියේ තිබුණා  රබර් ඇට 5ක්.
    - වට්ටියෙන් ඉවත් කළා රබර් ඇට 2 ක්.
    - වට්ටියේ ඉතුරු ඉතුරු වුණා රබර් ඇට 3ක්
- මේ ආකාරයට කිහිප වරක් ද්‍රව්‍ය කිහිපයක් ඉවත් කර ඉතුරු ගණන සෙවීමට දරුවාට කියන්න .